සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපනකලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புகல்விவலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2013
இரண்டாம் தவணைமதிப்பீடு - 2013
**Second Term Evaluation - 2013**

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | නැටුම් (දේශීය)I පත්‍රය<br>நடனம் (சுதேச)வினாத்தாள்-1<br>Dancing (Oriental)Paper I | *පැය එකයි*<br>*ஒருமணித்தியாலம்*<br>*One Hour* |

උපදෙස්

- ප්‍රශ්න අංක 1 - 40 දක්වා සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුවේ.
- ප්‍රශ්න අංක 26 - 40 දක්ව ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාළ කොටස තෝරාගන්න.

අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

(01) අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි මෙම කවි ගායනය අයත් වන්නේ ____________ නැටුම සඳහාය.

i කුලු ii ගොයම් iii කළගෙඩි iv ලී කෙළි

(02) ශාන්තිකර්මයක් පැවැත්වීමට සැලසුම් කිරීමේදී ප්‍රථමයෙන් ____________ චාරිත්‍රය සිදු කරයි.

i කප් සිටුවීම ii මඩු පේ කිරීම iii තොට පේ කිරීම iv මල පේ කිරීම

(03) '' තනායම්පොළ '' යනුවෙන් හැඳින්වෙන්නේ ____________ රංගමඩලයි.

i සොකරි ii කංකාරි iii කෝලම් iv යක්තොවිල්

(04) '' කඳුරු ගසක් ගෙන නියමෙටමේ ලෙස ගැනපත් '' මෙය ____________ කවියකි.

i සිරස පාද ii මෝල්ගස් iii මල්යහන් iv කඩතුරා

(05) මාත්‍රා 2 + 2 + 4 යන තාල රූපය හඳුන්වනු ලබන්නේ ____________ නමිනි,

i සුළු මැදුම් මහ තුන්තිත ii දෙමැදුම් මහ තුන්තිත
iii දෙසුළු මැදුම් තුන් තිත iv දෙසුළු මහ තුන්තිත

(06) ගම්පොළ යුගයට අයත් ____________ ලී කෙළි නැටුමේ රූකමක් දක්නට ලැබේ.

i ගඩලාදෙණියේ දේවාලයේ ii ඇම්බැක්කේ දේවාලයේ
iii ලංකාතිලක විහාරයේ iv පිළිමතලාවේ විහාරයේ

(07) මහනුවර පෙරහැරේ නර්තනය පැවති අයුරු දේශාටන වාර්තාකරුවෙකු වූ ____________ විසින් ලියා ඇත.

i ඉබන් බතුතා ii පාහියන් භික්ෂුව iii ජෝන් ඩේවි iv රොබට් නොක්ස්

(08) '' මිහිමඩලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා '' යන ගීතය ____________ චලන වර්ගයට අයත්වේ.

i රිද්මයානු කූල ii තාලානුකූල iii ප්‍රකාශනාත්මක iv නිර්මාණාත්මක

(09) කරදිය මුද්‍රා නාට්‍යයේ නිර්මාතෘ ලෙස ____________ හඳුන්වනු ලබයි.

i ඒස් පණිභාරත මහතා ii මුදියන්සේ දිසානායක මහතා
iii නිමල් වෙල්ගම මහතා iv චිත්‍රසේන මහතා

(10) නර්තනයේ ත්‍රිවිධ ලය ____________ යනුවෙන් හඳුන්වනු ලැබේ.

i විලම්භ , මධ්‍ය , දෘත ii සමග්‍රහ , විශ්‍රමග්‍රහ , අවග්‍රහ
iii තනිතිත, දෙතිත , තුන්තිත iv මිති , යති , ලය

• පහත සඳහන් වගුව ඇසුරෙන් අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල පිළිතුරු සපයන්න.

| A කොටස | B කොටස | C කොටස | D කොටස |
|---|---|---|---|
| ගැටබෙරය | දවුල | බුම්මැඩිය | පහතරට බෙරය |
| අවුල් හැරය | කාගුල් | උච්චපට්ටම් | තෙල්කච්චිය |
| පබළු හැට්ටය | උඩැක්කිය | මහනුවර | මදුරාසිය |
| රත්නපුරය | සීනිගම | ටිකාව | කඩතුරා කවි |

(11) ගද්‍ය හා පද්‍ය ලක්ෂණ ඇතුළත් ගායන විශේෂය වන්නේ ,

i A කොටසේය ii B කොටසේය iii C කොටසේය iv D කොටසේය

(12) සාම්ප්‍රදායන් තුනටම අයත් වාද්‍ය භාණ්ඩ හැරුණු කොට ගැමි නැටුම් සඳහා යොදාගන්නා වාද්‍ය භාණ්ඩ ඇතුළත් වන්නේ ,

i A සහ B කොටසේය ii B හා C කොටසේය

iii C සහ D කොටසේය iv C හා A කොටසේය

(13) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ කට්ටලයට ඇතුළත් ආභරණයක් වන්නේ ,

i B කොටසේ ii A කොටසේ iii D කොටසේ iv C කොටසේය

(14) දෙවොල් මඩු ශාන්තිකර්මයේදී පුද ලබන දොවොල් දෙවියන් ලක්දිවට ගොඩ බැසූ දේවාලය අයත් ප්‍රදේශය වන්නේ ,

i B කොටසේය ii A කොටසේය iii C කොටසේය iv D කොටසේය

(15) මෘදංගය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිතා කරන නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය සඳහන් වන්නේ ,

i D කොටසේය ii B කොටසේය iii C කොටසේය iv A කොටසේය

(16) නර්තනය ප්‍රධාන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය සිදු කෙරෙන නාට්‍ය වන්නේ ,

i ශෛලිගත නාට්‍ය ii ස්වභාවික නාට්‍ය

iii ගීත නාට්‍යය iv මුද්‍රා නාට්‍ය

(17) "පෙළලවන දිගුංගන තිලුපුල සේයා
ළෙල පමණින් රන් ලියවිල සේයා " මෙම කවි පදය කුමන සංදේශ කාව්‍යයක ඇතුළත්වේද ?

i ගිරා සංදේශය ii පරෙවි සංදේශය

iii සැළලිහිණි සංදේශය iv මයූර සංදේශය

(18) අද්භූත සහ ශාන්ත රසයට අයත් ස්ථායි භාව වනුයේ ,

i හාස්‍ය සහ ශෝක ii විශ්ම සහ භක්ති

iii උත්සාහ සහ භය iv භක්ති සහ උත්සාහ

(19) භරත නාට්‍ය සංදර්ශනය ප්‍රථම නර්තන අංගය වනුයේ ,

i වර්ණම් ii අලාරිප්පු iii පදම් iv මංගලම්

(20) කථක් නර්තනයේදී ලක්නව් , ජායිපූර් , සහ බෙනාරිස් ඝරානා යනුවෙන් නම් කෙරෙන්නේ ,

i ප්‍රචලිත ප්‍රදේශවේ ii ඉගැන්වෙන කේන්ද්‍රස්ථානය වේ

iii විශ්ව විද්‍යාල වේ iv ගුරුකුල වේ

(21) කථක් නර්තන සඳහා වාදනය කරනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩය මින් කවරක්ද ?

i හින්දුස්ථානි සංගීතයට අයත් කෝල්බෙරයයි

ii හින්දුස්ථානි සංගීතයට අයත් තබ්ලාවයි

iii කර්ණාටක සංගීතයට අයත් මෘදංගයයි.

iv හින්දුස්ථානි සංගීතයට අයත් තවිල් බෙරයයි

(22) ජන ඇදහිලි සහ ජන නාටක ආශ්‍රයෙන් බිහි වූ භාරතීය නර්තන සම්ප්‍රදාය කුමක්ද ?

i භරත ii කථක් iii කථකලී iv මණිපුරි

(23) කථකලී නර්තන සම්ප්‍රදායේ හිස්පළදනාව කුමන නමකින් හඳුන්වනු ලබයිද ?

i කිරීටම් ii රිෂම් පුරිටි iii කොක්තුම්බි iv උච්ච පට්ටම්

(24) තම්මැට්ටම හි ප්‍රධාන කොටස් දෙක වනුයේ ,

i ලක බුරුල , බෙරපුහුල ii ඇඩි කොටස , මණ්ඩම

iii සුරත් තට්ටුව , ඉල්ලම iv වලයම , ගැටිය

(25) කිතුල් තතක් බඳිනු ලබන්නේ කුමන වාද්‍ය භාණ්ඩයේද ?

i තම්මැට්ටම ii රබාන iii අත් රබාන iv උඩැක්කිය

## II පත්‍රය ( උඩරට නර්තනය )

(26) සාම්ප්‍රදායික උඩරට නර්තන කලාව වඩාත් ප්‍රචලිත ප්‍රදේශ ඇතුළත් වරණය කුමක්ද ?

i මහනුවර , කෑගල්ල , රත්නපුරය

ii මැද මහනුවර , නුවර එළිය , කුරුණෑගල

iii මැද මහනුවර , මාතලේ , නුවරඑළිය

iv මහනුවර , කුරුණෑගල , කෑගල්ල

(27) උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික වචන වේ.

i ගොඩ සරඹ , කස්තිරම , සීරුමාරුව ii සීරුමාරුව , හමාරපදය , ආරම්භක පදය

iii කස්තිරම , සීරුමාරුව , අඩව්ව iv පා සරඹ , සුරල් , වට්ටම්

(28) මෙය මාත්‍රා 3 තනි තිතට අයත් බෙර පදයකි.

i දොං දොජිං ජිං ගත ජිං කුඳ ii දොමිත දොමිත දොං දොමිකිට කිට දොං

iii ජි ං කඩතක ජිං කුඳ කුඳ iv ජිංකඩ කඩතක තක්කට තරිකිට

(29) වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් ඇතුළත් වී ඇත්තේ කුමන වරණයේද ?

i තෝඩුපත් , පාහිම්පත , උරමාලය ii ජටා පටිය , තෝඩුපත් , ශිඛාබන්ධනය

iii පාහිම්පත , උරමාලය , නාගල iv ජටාව , කඩුක්කන් , රැලිමන්ත

(30) කොහොඹා කංකාරියේ කොහොඹා දෙවියන්ට අමතරව පුද ලබන දෙවිවරුන් වන්නේ ,

i රුප්පා යකුන් , විෂ්ණු ii අඹරාපති , නාථ

iii වීරමුණ්ඩ , කතරගම iv බණ්ඩාර දෙවිවරු , වැදි යකුන්

(31) '' සුරිඳුන් පෙර සිටන් පලයුත් සැවතිඳුන් '' සැවුලා වන්නමට අයත් මෙම කවිපදයේ ඉතිරි පදය කුමක්ද ?

i දැරුපා අත ලුවෙන් පලු දෙක ගෙන සැනෙකින්

ii අසුරන් කළ යුදෙන් ජයගෙන කඳ කුමරුන්

iii සහ ගොස් කළ යුදෙන් අසුරන් ජය නොලදින්

iv සැවුලා නම එයින් ලොව පළකළ උපතින්

(32) උඩරට නර්තන සඳහා භාවිතා කරන භාණ්ඩ මේවායින් තෝරන්න.

i ගැටබෙරය , දිග්බෙරය , උඩැක්කිය , පන්තේරුව

ii ගැටබෙරය , තාලම්පට , පන්තේරුව , උඩැක්කිය

iii ගැටබෙරය , පන්තේරුව , දඬුබෙරය , තාලම්පට

iv ගැටබෙරය , තාලම්පට , බුම්මැඩිය , උඩැක්කිය

(33) ගැටබෙරයේ කොටස් වන්නේ .

i බෙර සිවිය , කැපුම්හම , කන්වරය

ii ඉල්ලම් , සුරත්තට්ටුව , බෙර ඇස

iii වෙනිවර කැරැල්ල , ගැටය , වලයම

iv කැපුම්හම , සුරත්තට්ටුව , වෙනිවර කැරැල්ල

(34) කුදංත ගතකුද දොම්කිට තරිකිට කුංදත් තා - - - මෙය .

i මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට අයත් කස්තිරමකි

ii මාත්‍රා 2 + 2 +4 තුන් තිතට අයත් කස්තිරමකි

iii මාත්‍රා 2 + 2 + 4 තුන් තිතට අයත් සීරුමාරුවකි

iv මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට අයත් සීරුමාරුවකි

(35) කොහොඹා කංකාරි ශාන්තිකර්මයට අයත් චාරිත්‍ර විධි අතුරෙන් දෙකකි ,

i තොටමෙට යෑම , තොරන් යාගය ii භූමිය නියම කිරීම , කප් සිටිවීම

iii කප් සිටුවීම , මඩු පේ කිරීම iv මලපේ කිරීම , තාල පන්දම් පූජාව

(36) මේ අය උඩරට නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූවන් වේ

i නිත්තවෙල ගුණයා , කේ . එස් ප්‍රාන්නදු සහ චිත්‍රසේන

ii එස්. පණිභාරත , ජේ. ඊ සේදරමන් , නිත්තවෙල ගුණයා

iii වසන්ත කුමාර , ශේෂා පලිහක්කාර , අල්ගම කිරි ගනිත ගුරු

iv ඩබ්.බී. මකුලොලුව , ප්‍රේමකුමාර , චන්ද්‍රලේඛා

(37) ගත්තකු පිත්තම් ගජිතකු ________________ තරිකිට පිත් ______________ තා මෙහි ගැළපෙන පදය තෝරන්න.

i කුංදත් - තරිකිට කුංදත් ii පිත්තම් - තරිකිට දොම්කිට

iii පිත්තම් - කඩතක තරිකිට iv කුංදත් තරිකිට දොම්කිට

(38) කොහොඹ කංකාරියේ නර්තන අවස්ථා කිහිපයක් දැක්වෙන වරණය කුමක්ද ?

i යක් ඇනුම , මල්හත පදය , මුවමල විදීම

ii යක් ඇනුම , හත් පදය , කුවේනි අස්න

iii යක්කම හත් පදය , ගුරුගේ මාලාව

iv මහා යාතිකාව , හත්තාලය , කුවේණි අස්න

(39) ඊශ්වර දෙවියන් පිළිබඳව ද සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳව ද වර්ණනා වන වන්නම් දෙක කුමක්ද ?

i වෛරොඩි වන්නම හා තුරඟා වන්නම ii සැවුලා වන්නම හා තුරඟා වන්නම

iii වෛරොඩි වන්නම හා යිඅඩි වන්නම iv තුරඟා වන්නම හා සැවුලා වන්නම

(40) සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්මයකි ,

i වලියක් මංගල්‍යය ii ගරාමඩුව iii බලි iv ගිනි මඩුව

## III පත්‍රය ( පහතරට නර්තනය )

(26) පහතරට නර්තන කලාවේ ප්‍රධාන ගුරුකුල දැක්වෙන වරණය කුමක්ද ?

i කළුතර , බලපිටිය , අම්බලන්ගොඩ ii ගාල්ල , මාතර , තංගල්ල

iii මාතර , ගාල්ල , අම්බලන්ගොඩ iv මාතර , බෙන්තර , රයිගම

(27) පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේනික වන්නේ ,

i ඉලංගම් සරඹ , අන්තාඩිය , ඉරට්ටිය ii දොඹින පද , සුරල , අන්තාඩිය

iii ඉරට්ටිය , බඹර වළල්ල , ගොඩසරඹ iv ඉරට්ටිය , ඉලංගම් සරඹ , කලාසම්

(28) මෙය මාත්‍රා 3 තනි තිතට අයත් බෙර පදයකි ,

i දොං දොං ගත ගත් දිත්තකු ii ගුං දෙගත ගත්ත ගුං

iii ගුංද දෙගත ගති ගත ගුද iv ගුං ගුං ගදි ගත ගුංද දෙගත ගත

(29) තෙල්මේ ඇඳුම් කට්ටලයේ කොටස් ඇතුළත් වරණය කුමක්ද ?

i තෝඩුපත් , සේලය , ගෙජ්ජි කුට්ටම

ii නළල් පටිය , හැට්ටය , ඉනහැඩය

iii හැට්ටය , වරළ , කඩුක්කන්

iv හිසට බඳින රෙද්ද , නළල් පටිය , ඉන හැඩය

(30) දෙවොල් මඩු ශාන්තිකර්මයේ දෙවොල් දෙවියන්ට අමතරව පුද ලබන දෙවිවරුන් නම් ,

i පත්තිනි සහ කොණ්ඩමාල ii විෂ්ණු සහ සූනියම්

iii දැඩිමුණ්ඩ සහ කතරගම iv පත්තිනි සහ කතරගම

(31) '' සඳ සන්දර දිගු සුන්දර දිළිවන් බඹ යසටා '' - - මෙම කවිපදයේ ඊළඟ පදය කුමක්ද ?

i සඳ සන්දර ප්‍රතිවල්ලභ සෙත් දෙන් සව් සතටා

ii සඳ සන්දර නව මන්තර අදහාගත් ලෙසටා

iii සඳ සන්දර පැරදුණු මෙත් සැඟවී මෙර ගිරටා

iv සඳ සන්දර පායාදිසි නෙක තරුවැල් ලෙසටා

(32) පහතරට නර්තනය සඳහා භාවිත වන භාණ්ඩ හා මෙවලම් වන්නේ ,

i දෙවොල්බෙරය , තම්මැට්ටම , වෙස්මුහුණු

ii දෙවොල් බෙරය , වෙස්මුහුණු , පන්දම

iii යක්බෙරය , හේවිසිය , තාලම්පට

iv පහතරට බෙරය , හොරණෑව , තම්මැට්ටම

(33) පහතරට බෙරයේ කොටස් වන්නේ ,

i වරපටිය , ඉල්ලම , වලයම ii බෙරකඳ , හයි තට්ටුව , කයිපුඩි වළල්ල

iii තට්ටුව , හයි තට්ටුව , බෙරපුහුල iv බෙර හැක්ම , කන්වරය , වෙනිවර

(34) ගුංදත් ගුහිතිගදිරිකිට ගතගත ගහිතිගතම් - - - - මෙය

i මාත්‍රා 4 තනිතිතට අයත් අත්තාඩියක කොටසකි

ii මාත්‍රා 4 තනිතිතට අයත් සුරළක කොටසකි

iii මාත්‍රා 3 තනිතිතට අයත් ඉරට්ටියක කොටසකි

iv මාත්‍රා 3 තනිතිතට අයත් බෙරපදයක කොටසකි

(35) දෙවොල් මඩු ශාන්ති කර්මයට අයත් චාරිත්‍ර අතුරෙන් දෙකකි ,

i කාල් පන්දම් පූජාව , මී කැඩීම ii තොරන් යාගය , හගල යැදීම

iii මඩු පේ කිරීම , තොටමෙට යෑම iv කිරි ඉතිරීවීම , පහන් දැල්වීම

(36) මේ අය පහතරට නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූවන්වේ.

i පණිභාරත් , එම් . එච්. ගෝමිස් , වසන්ත කුමාර

ii සවුරිස් සිල්වා , කේ .එස් .ප්‍රනාන්දු , විල්සන් ඔලබොඩුව

iii සන්දෝරිස් ජයන්ත, සවුරිස් සිල්වා , බැසිල් මිහිරිපැන්න

iv එස් .එල් .එච් .ප්‍රනාන්දු , ඩබ්. ඒඩින් , ඒ .ඉඹුල්ගොඩ

(37) " දොම්ත ගදිත ගත _________ ගුංදැහිං දොම් දොම් _________ රෙගුදකු දොම් "

ඉරට්ටිය සඳහා ගැළපෙන පදය තෝරන්න.

i දිත ගත - ගුජි තිහ දිරිකට ii තත් දැහිං , දිත ගත ගුදි ගත

iii ගුංදැහිං ගුංදැහිං - දෙගුදකු iv තරිකිට දිත් - දිරිකිට ගුද

(38) දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන නර්තන අවස්ථා කිහිපයක් දැක්වෙන වරණය කුමක්ද ?

i තෙල්මේ නැටීම , අඹ විදමන , හලං වැඩමවීම

ii තෙල්මේ නැටීම , වාහල නැටීම , අයිලේ යැදිම

iii දෙවොල් ගොඩබැසීම , කොල්පාඩුව , තොරන් යාගය

iv පත්තිනි පද , අයිලේ යැදිම , මරා ඉපැද්දීම

(39) සින්දු වන්නම් රචනා වූයේ කුමන යුගයේද ?

i දඹදෙණි යුගය ii මහනුවර යුගය iii කුරුණෑගල යුගය iv කෝට්ටේ යුගය

(40) සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්මයකි .

i වලියක් මංගල්‍යය ii ගරා මඩුව iii බලි iv ගී මඩුව

## IV පත්‍රය ( සබරගමු නර්තනය )

(26) සබරගමු නර්තන සම්ප්‍රදායේ ගුරු පරම්පරා හා සම්බන්ධ වඩාත් ප්‍රචලිත ප්‍රදේශ හඳුන්වන වරණය කුමක්ද ?

i කලවාන , කුරුවිට , රුවන්වැල්ල ii රත්නපුරය , අවිස්සාවේල්ල , ඇඹිලිපිටිය

iii ඇලපාත , නිවිතිගල , බලංගොඩ iv ඇලපාත , රද්දැල්ල , පැල්මඩුල්ල

(27) සබරගමු නර්තන සම්ප්‍රදායට ආවේණික වචන වේ,

i දොඹින පද , ගමන් මාත්‍රය , කලාසම ii පට්ටුතාල මාත්‍රය , පා සරඹ , කලාසම

iii මාත්‍රා පහ , සීරුමාරුව , අඩව්ව iv දෙඹින පද , ගොඩ සරඹ , මාත්‍රා පද

(28) මෙය මාත්‍රා 3 තනි තිතට අයත් බෙර පදයකි ,

i කුංදත් තක්කඩ තකට පිංකඩ ii පිමිත කුද දොං

iii පිං කිටිතක් තක්කිට තක iv පිං පිමිත තත් තකට

(29) පහන් මඩුව ශාන්තිකර්මයට අයත් වස්ත්‍රාභරණ කට්ටලයේ කොටස් ඇතුළත් වරණය කුමක්ද ?

i උලදඩය , රතුරෙද්ද , පච්චවඩම

ii ජටාව , නෙත්තිමාලය , කඩුක්කන්

iii නෙත්ති මාලය , උර මාලය , පබළු හැට්ටය

iv ජටාව , කරතැල්ල , ඒකාංක මාලය

(30) පහන්මඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරුන් නම් ,

i කළු කුමාර සහ විරමුණ්ඩ ii විෂ්ණු සහ දැඩිමුණ්ඩ

iii සමන් සහ ශක්‍ර iv පත්තිනි සහ සමන්

(31) '' සත් සුත් ලෙස උතුම් පුන් පුන් සිරි රඳුන් - - - '' මෙම කවි පදයේ ඊළඟ පදය කුමක්ද ?

i සුන් සුන් නඳ දෙමින් වටකර ගෙන එකල

ii එන් එන් හට ඉතින් බැරිවෙයි සිත් අවුල්

iii නන් නන් සිය දහස් පිරවර සිට එකලා

iv දැන් දැන් හට කියන් මෙ වන්නම සැවුලා

(32) සබරගමු නර්තනය සඳහා භාවිත වන භාණ්ඩ හා මෙවලම් වන්නේ මොනවාද ?

i දවුල , තම්මැට්ටම සහ විලක්කුව ii දවුල , තාලම්පට සහ පහන්

iii දවුල , පොකුරු බෙරය , පහන් iv දවුල , උඩැක්කිය සහ දෙකොන විලක්කුව

(33) දවුලට අයත් කොටස් වන්නේ ,

i මණ්ඩම , ගැටය , තට්ටුව

ii කයිපුඩි වළල්ල , කඩිප්පුව , වෙනිවර කැරැල්ල

iii වරය , ලණුව , සුරත්තට්ටුව

iv ගැටිය , ඉල්ලම් , තට්ටුව

(34) කුද කුදිත ගත ගදිත කුදගදිත කුද තා - - - මෙය ,

i මාත්‍රා 3 තනිතිතට අයත් කලාසමකි ii මාත්‍රා 2 + 3 දෙතිතට අයත් කලාසමයි

iii මාත්‍රා 2 + 4 දෙතිතට අයත් කලාසමකි iv මාත්‍රා 4 තනිතිතට අයත් කලාසමකි.

(35) පහන් මඩු ශාන්තිකර්මයට අයත් චාරිත්‍ර විධි අතුරෙන් දෙකකි .

i මිල්ල කැපීම , මාරාව ii මඩු පේ කිරීම , ගබඩා කොල්ලය

iii මඩු පේ කිරීම , මිල්ල කැපීම iv කිරි ඉතිරවීම , හගල යැදීම

(36) මේ අය සබරගමු නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූවන් වේ ,

i අල්ගම කිරි ගණිත ගුරු , සිරිබෝහාමී , මහවල තැන්න බණ්ඩාර

ii සිරිබෝහාමී , පොඩිමහත්මයා , හීන්නිලමේ

iii ඒ ඒ දෙල්ගොඩ , ඩිංගිරි මුදියන්සේ , සිව්රිස් සිල්වා

iv පොඩි මහත්තයා , හීන් නිලමේ , සුරඹා ගුරු

(37) තත් තරිගු තත් තකට ______________ තකට තහජ්ජිත් කිනං තකට ______________ ජෙං තා යන අඩව්වට ගැළපෙන පද තෝරන්න.

i ජිං ජිං තත් - තරිකිට කුඳ ii ජෙජ් ජෙං කිනං - තරිකිට තකට

iii ජෙංත ජෙංගත - ගදිගත තකට iv ජිං ගතත් - ජිග් තත්

(38) පහන් මඩුවේ එන නර්තන අවස්ථා කිහිපයක් දැක්වෙන වරණය කුමක්ද ?

i දේව කෝල්පාඩුව , දෙවොල් ගොඩ බැසීම , පොක්කඩේ පාළිය

ii තෙල්මේ , හත්පද පෙළපාලිය , දේව කොල්පාඩුව

iii තෙල්මේ , මල්පද , රාමා මැරීම

iv හත් පද පෙළ පාළිය , මල්පද , පොක්කඩේ පාළිය

(39) අශ්වයෙකු සහ සාවෙකු පිළිබඳ වර්ණනා වී ඇති වන්නම් දෙක කුමක්ද ?

i කුදිරඩි වන්නම සහ මුසලඩි වන්නම ii අනිලා වන්නම සහ මණ්ඩුක වන්නම

iii මණ්ඩුක වන්නම සහ කුදිරඩි වන්නම iv කුදිරඩි වන්නම සහ විරාඩි වන්නම

(40) සාම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්ති කර්මයකි .

i වලියක් මංගල්‍යය ii ගරා මඩුව iii බලි iv ගී මඩුව

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපනකලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புகல்விவலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2013
இரண்டாம் தவணைமதிப்பீடு - 2013
**Second Term Evaluation - 2013**

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | නැටුම් (දේශීය)II පත්‍රය<br>நடனம் (சுதேச)வினாத்தாள்-11<br>Dancing (Oriental)Paper II | *පැයදෙකයි*<br>*இரண்டுமணித்தியாலங்கள்*<br>*Two Hours* |
|---|---|---|

පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) i උඩරට නැටුම් කලාව නැමති කෘතිය ලියා පළකරන ලද්දේ ____________ විසිනි.

ii දේශීය නර්තන සම්ප්‍රදායේ රසභාව වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ____________ සම්ප්‍රදායේය.

iii වීරත්වය විදහා පාන ගැමි නැටුමක් ලෙස ____________ නැටුම හැඳින්විය හැකිය.

iv බලි ශාන්ති කර්ම වලදී ____________ කවි ගායනු කරනු ලබයි.

v ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු කල කොහොඹා කංකාරියක් කළ බව ____________ සඳහන්වේ.

vi කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා හඳුන්වන නාමය කුමක්ද ? ____________

vii සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය ____________ වර්ෂයේ දී පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත්විය.

viii අස්නේ , කොහොඹාගැල්ල යන නර්තන අංග ____________ නර්තන සම්ප්‍රදායට අයත්වේ.

ix පහත නම් සඳහන් ශිල්පීන් දෙදෙනා කුමන නර්තන සම්ප්‍රදායන්ට අයත්ද ?

I රද්දැල්ලේ පොඩි මහත්තයා ----------------------------------------

II A ඉඹුල්ගොඩ මහතා ----------------------------------------

x කෝලම් නාට්‍යයේ දැක්වෙන ස්ත්‍රී චරිත දෙකක් හඳුන්වන්න.

I ____________________

II ____________________

( 1 x 12 )

(02) පහත සඳහන් මාතෘකාවලින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1) උඩැක්කිය 2) අවකාශ භාවිතය 3) ගැමි නැටුම්

4) වන්නම් 5) ත්‍රිවිධ ලය ( ල : 4 x 3 = 12 )

(03) I " ඒ වින්න මේ වින්න ගත් වින්න හාවා " මෙම රබන් පදය මාත්‍රා 2 + 3 දෙතිතට ප්‍රස්තාර කරන්න. ( ල : 04 )

II මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් වන්නමක එක් කවි පදයක් ප්‍රස්තාර කරන්න. ( ල : 04 )

III මාත්‍රා 4 තනි තිතට අයත් කස්තිරමක් ප්‍රස්තාර කරන්න. ( ල : 04 )

(04) I නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මහනුවර යුගයට අයත් දේශාටන වාර්තා දෙකක් නම් කරන්න. ( ල : 04 )

II මහනුවර යුගයේ ප්‍රභූ පවුල් වල නර්තනය යොදාගත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ( ල : 05 )

III එම යුගයේ දක්නට ලැබෙන රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ සාධකයක් ඉදිරිපත් කරන්න. ( ල : 03 )

(05) I කථකලි නර්තන සම්ප්‍රදාය ප්‍රභවය වීමට බලපෑ ආගමික පසුබිම කෙටියෙන් විස්තර කරන්න. (ල : 04 )

II කථකලි නර්තන සම්ප්‍රදාය බිහි කළේ කවුද ? ඒ සඳහා වූ ආයතනය කුමක්ද ? ( ල : 02 )

III කථකලි වේෂ නිරූපණය ගැන විස්තර කරන්න. ( ල : 06 )

(06) I ශාන්ති කර්මයන්හී දක්නට ලැබෙන සාරධර්ම 05 ක් ලියන්න. ( ල : 05 )

II යහපත් සමාජයක් උදෙසා සාරධර්ම අනුගමනය කළ යුතු ආකාරය විස්තර කරන්න.( ල : 07 )

(07) I සොකරි නාටකය හා කෝලම් නාටක වඩාත් ප්‍රචලිත ප්‍රදේශ දෙක බැගින් ලියන්න. ( ල : 04)

II එක් නාටකයක එන චරිත දෙක බැගින් හඳුන්වන්න. ( ල : 04)

III එම නාටක පැවැත්වීම තුළින් දිස්වන ගැමි ජනතාවගේ අපේක්ෂණා පිලිබඳ පැහැදිලි කරන්න. ( ල: 04)